සියලුම හිමිකම් ඇවිරිණි/முழுப் பதிப்புரிமையுடையது/All Rights Reserved

දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
தென் மாகாணக் கல்வித் திணைக்களம்
Department of Education, Southern Province

අවසාන වාර පරීක්ෂණය - 2023 (2024)
ஆண்டிறுதிப் பரீட்சை - 2023 (2024)/ Final Term Test - 2023 (2024)

31284

| | | |
|---|---|---|
| ශ්‍රේණිය / தரம் / Grade: 9 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය | කාලය / நேரம் / Time: පැය 2 යි |

නම / பெயர் / Name ..................................................... විභාග අංකය / சுட்டிலக்கம் / Index No. ...............................

## I - කොටස

★ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

● අංක 1, 2 ප්‍රශ්නවල ඉරි ඇඳි පදවලට වඩාත් ගැළපෙන අර්ථය ඇති පිළිතුර තෝරන්න.

1. සුනිල් <u>පණට පණ මෙන්</u> මිතුරන් ඇසුරු කරයි.

(1) දැඩි මිතුරු බවින් (2) හුස්ම තිබෙන තුරු (3) දීර්ඝ කාලයක් (4) දිවි රකිමින්

2. 'මේ දිනවල <u>වැලේ වැල් නෑ</u> 'යනුවෙන් තාත්තා මුදලාලිට පැවසුවේ ය.

(1) ගහක් වැලක්වත් නෑ (2) මහත් ආර්ථික අමාරුකම් ඇති

(3) රස්සාවක් නැති (4) වාසියක් නැති

● අංක 3,4 ප්‍රශ්නවල ඉරි ඇඳි පදයේ අර්ථයට සමාන පිළිතුර තෝරන්න.

3 " ස්වාමීනි, මේ ලොව මෙයට වඩා <u>පියයුත්තෙක්</u> නැතැ "යි කී ය.

(1) බීමට සුදුසු දෙයක් (2) පියා වැනි කෙනෙක් (3) කළ යුතු යුතුකමක් (4) වසා තැබිය යුතු දෙයක්

4. සිරිසෝම සිය වෘත්තිය පිළිබඳ මනා <u>පරිචයක්</u> ඇත්තෙකි.

(1) සංයමයක් (2) පරිච්ඡේදයක් (3) පළපුරුද්දක් (4) වගකීමක්

5. කණ්ඨජ අක්ෂර පමණක් ඇතුළත් වරණය තෝරන්න.

(1) ක, ඛ ,ග, ඝ, ඞ (2) ප ,ඵ ,බ ,භ. ම (3) ත, ථ ,ද, ධ .න (4) ච, ඡ ,ජ, ඣ. ඤ

6. අකාරාදි පිළිවෙළට සැකසූ විට නිවැරදි වරණය තෝරන්න.

(1) සුභාෂිතය, හත්පණ, අමාවතුර, බුත්සරණ (2) අමාවතුර, හත්පණ, බුත්සරණ, සුභාෂිතය

(3) අමාවතුර, බුත්සරණ, සුභාෂිතය, හත්පණ (4) සුභාෂිතය, අමාවතුර, හත්පණ, බුත්සරණ

7. ඉරි ඇඳි පදය අයත් වන ක්‍රියා පද වර්ගය කුමක් ද ?

ගුරුවරු සිසුන් ලවා පන්තිය පිරිසිදු <u>කරවති.</u>

(1) ප්‍රයෝජ්‍ය ක්‍රියා (2) මිශ්‍ර ක්‍රියා (3) විධි ක්‍රියා (4) කාලාර්ථයේ අසම්භාව්‍ය ක්‍රියා

8. අක්ෂර වින්‍යාසය නිවැරදි ලෙස යොදා ඇති පිළිතුර තෝරන්න.

(1) දුෂ්කර, විනිශ්චය, ප්‍රශ්ණ, ලේඛම් (2) විශිෂ්ට, සමස්ත, කාර්යාලය, පිළිමය

(3) කණිෂ්ඨ, ප්‍රවීණ, වර්ථමාන, බනිජ (4) නිරූපණය, දේශගුණය, විශ්මය, ශිෂ්ඨාචාරය

9. "කර" යන බහ්වර්ථ පදයේ අර්ථය නොදෙන වරණය වන්නේ,

(1) අත (2) බෙල්ල (3) හොඬ (4) කරදර

10. උක්ත පද පමණක් යෙදෙන වරණය තෝරන්න.

(1) මිනිසුන්, සිසුහු, කාන්තාවක්, ඔවුන්
(2) ඔවුහු, මිනිස්සු, මිනිසෙකු, ළමයි
(3) ස්ත්‍රියක්, ගොවියෝ, ගුරුවරු, ශිෂ්‍යයෙක්
(4) කම්කරුවෙකු, ඇමතිවරු, තා, මගීන්

11. නිපාත පද පමණක් ඇතුළත් වන වරණය කුමක් ද ?

(1) අද, සහ, බැගින්, නුඹ
(2) දක්වා, කැටුව, හා, සුදන
(3) සමග, එම්බල, තරු, හෙවත්
(4) උදෙසා, මෙන්, අනේ, ඉක්බිති

12. වනය, ජලය යන පදවලට සමානාර්ථය පිළිවෙළින් යෙදී ඇති වරණය තෝරන්න.

(1) අරණ, තුර (2) බැද්ද, උදක (3) තුමුල, දිය (4) රුවනාර, අඹ

- නිවැරදි වාක්‍යය සහිත වරණය තෝරන්න.

13. (1) ගව රළ පාර හරහා යති.
(2) අයෙක් පාරේ ගමන් කරයි.
(3) තෙරණුවෝ දහම් දෙසයි.
(4) තාරකා පෙළ අහසේ දිදුලති.

14. (1) ඇතැමුන් ගී ගයති.
(2. ) සමහරු විභාගයට පෙනී සිටියි.
(3) සිසුහු චාරිකාවට සහභාගී විය.
(4) ගංගාවෝ වැස්සෙන් පිටාර ගලති.

15 (1) දරුවන් විසින් සුරතල් සතුන් රැකබලා ගැනෙති
(2) දරුවන් විසින් සුරතල් සත්තු රැකබලා ගැනෙති.
(3) දරුවෝ විසින් සුරතල් සතුන් රැකබලා ගැනෙති.
(4) දරුවන් විසින් සුරතල් සත්තු රකිති.

16. ක්‍රියා රූප පමණක් එකතුවීමෙන් සැදුණු යුගල පද පමණක් යෙදී ඇති වරණය තෝරන්න.
(1) කියුම් කෙරුම්. සිතු පැතු, නැටූ ගැයූ, කන බොන
(2) කැපිලි කෙටිලි, අරුම පුදුම, හැඬූ දෙඩූ, කා බී
(3) ලියන කියන, ලවක් දෙවක්, කියූ කෙරූ, කැපූ කෙටූ
(4) ලියුම් කියුම්, වං හුං, දුවන පනින, කවා පොවා

17. 'අම්බාවන්' නමින් ධීවර භාෂාවේ දී හඳුන්වන්නේ කුමක් ද ?
(1) මාළු විශේෂයක්
(2) මුහුදු යාත්‍රාවක්
(3) දැල් අදින විට ගායනා කරන කවි
(4) මුහුදේ චණ්ඩ රළ

18. විරුද්ධ අර්ථය සහිත පද යුගලය ඇතුළත් වරණය වන්නේ,
(1) උත්තම - උතුම්
(2) නිදොස් - නිර්දෝෂ
(3) පිරිසිදු - සුපිරිසිදු
(4) එළිය - අඳුර

19. පහත සඳහන් ප්‍රස්තාව පිරුළ සම්පූර්ණ කිරීමට සුදුසු පිළිතුර ඇතුළත් වරණය වන්නේ,
ගල හොඳ නම් අඹරන ...................................... මක් වේ ද ?
(1) දුරු (2) කහ (3) මිරිස් (4) කුඩු

20. සිරම්බි අඩියේ කැෆ්ර් ජනයා සතුව සාම්ප්‍රදායික ගීත සිය ගණනක් පවතී. ඒ සියල්ල රචනා වී ඇත්තේ කුමන බසකින් ද ?
(1) සිංහල (2) ඉංග්‍රීසි (3) පෘතුගීසි (4) අරාබි

(ලකුණු 2 × 20 = 40 යි )

# II - කොටස

★ සියලු ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(01) සිංහල පෙළ පොතේ ඇතුළත් 'මහාසාර පලදනාව' පාඩමේ ක්‍රියාකාරකම් ඇසුරින් පිළිතුරු ලියන්න.

1. මහාසාර නාට්‍යයේ ඔබ සිත් ගත් චරිත දෙකක් නම් කරන්න.
2. මහාසාර නාට්‍යයේ ඔබ සිත් ගත් අවස්ථාවක් ඔබේ වචනයෙන් ලියන්න.
3. ඔබ සිත් ගත් චරිතය පන්තියේ රඟපෑමට අවස්ථාව ලැබී ඒ සඳහා සූදානම් වූ අයුරු කෙටියෙන් ලියන්න.
4. මහාසාර නාට්‍ය පෙළ රඟපෑමේ දී ඔබ හෝ ඔබේ කණ්ඩායම හෝ මුහුණ දුන් ගැටලු දෙකක් ලියන්න.
5. නාට්‍ය පිටපතක් රචනා කිරීමට සුදුසු , ඔබ ලැබූ අත්දැකීමක් ලියන්න.

(ලකුණු 2 × 5 = 10 යි)

(02) පහත සඳහන් මාතෘකාවලින් එකක් තෝරා ගෙන වචන 200කට නො අඩු රචනයක් ලියන්න.

1. වැඩිහිටියන් රැක බලා ගනිමු.
2. ප්‍රිය වචනය සතුට බෙදයි.
3. අධ්‍යාපන චාරිකාවේ සොඳුරු මතකයන්
4. අපි විනයගරුක හොඳ දරුවෝ වෙමු.

(ලකුණු - 20)

(03) පාසල් පන්ති කාමරය ඉගෙනුම් පරිසරයකින් යුක්ත ව නිම කිරීමට අවශ්‍ය ද්‍රව්‍ය 'සියපත' අධ්‍යාපනික අලෙවි සැලෙන් මිල දී ගත හැකි දැ' යි විමසා එහි කළමනාකාරතුමාට යවනු ලබන ලිපිය සකස් කරන්න. 9 ශ්‍රේණියේ පන්ති නායකයා ඔබ යැයි සිතන්න.

(ලකුණු - 10)

(04) පහත සඳහන් ඡේදය කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

රජරට පුරා දැනට පවතින දැඩි නියඟය නිසා ගොඩ වී වගාව සහ බෝග වගාව විනාශ වෙමින් පවතී. තද හිරු රැසින් ගොයම් පැළ කේඩැරි වී වියළී ගොස් ඇත. මාස ගණනක් තිස්සේ වැසි නො ලැබීම නිසා වැඩිපුර පාඩු සිදු වී ඇත්තේ බෝංචි වගා කළ ගොවීන්ට ය. නියඟය නිසා ළපටි බෝංචි පැළ මැලවී යන්නටත් බෝංචි මල් වියළී බිමට වැටෙන්නටත් පටන් ගෙන ඇත. දැනට පවතින තද ඉඩෝරය නිසා වැව් සියල්ල ම පාහේ සිඳී ගොස් ය. අහස් දියෙන් වැඩ කරන ගොවීහු ද වැව් දිය ප්‍රයෝජනයට ගන්නා ගොවීහු ද වැසි වසින තුරු නො ඉවසිල්ලෙන් බලා සිටිති.

1. ඡේදයේ සඳහන් පරිදි නියඟය පවතින්නේ කුමන ප්‍රදේශයක ද ?
2. නියඟය නිසා විනාශ වී ඇත්තේ මොනවා ද ?
3. ඡේදයේ සඳහන් පරිදි වැඩිපුර ම පාඩු සිදු වී ඇත්තේ කවුරුන් ට ද?
4. බෝංචි වගාවට හානි සිදු වී ඇත්තේ කෙසේ ද ?
5. වැසි වසින තුරු නො ඉවසිල්ලෙන් බලා සිටින්නේ කවුරුන් ද ?

(ලකුණු 2 × 5 = 10 යි)

(05) පෙළ පොත ඇසුරෙන් නිවැරදි පිළිතුරු ලියන්න.

1) ජාතිය රන් විමනක් වේ
ආගම මිණි පහනක් වේ
එය රැක ගන්නට මෙලො වේ
.......................................................................................

1 ඉහත කවියේ ඉතිරි පදය ලියන්න.
2 ඉහත කවිය උපුටා ගත් කෘතිය ලියූ කතුවරයා නම් කරන්න .

2) "... එහෙනම් ඔහේ මුන්නැහැව ඒ කාලෙ ඉඳල දන්නවා ..."

1 මෙම ප්‍රකාශය කරන ලද්දේ කවුරුන් විසින් ද ?

2 මෙම ප්‍රකාශය කරන ලද්දේ කා හට ද ?

3)

1 'දෑසේ නිල් පැහැය' පද්‍ය පන්තිය උපුටා ගත් කාව්‍ය සංග්‍රහය නම් කරන්න .

2 එම කෘතිය ලියූ කතුවරයා නම් කරන්න.

4)

1 "ඇසේ මතුවන කඳුළු බිඳු ගෙන ..." ගීතය ලියූ රචකයා නම් කරන්න .

2 "පියාසර කර ආමි - දේශයෙන් දේශයට ..." ගීතය ගායනා කරන්නේ කවුද ?

5)

1 'දේශීය නර්තනයේ රන් සලකුණ' නමින් හැඳින්වෙන්නේ කවුද ?

2 කඨින චීවර පෙරහැර පන්සලට ඇතුළු වන වේලාව ගැමි ව්‍යවහාරයේ හඳුන්වන්නේ කෙසේ ද?

(ලකුණු 2 × 5 = 10 යි)

# LOL.lk BookStore

# විභාග ඉලක්ක පහසුවෙන් ජයගන්න

ඕනෑම පොතක් ඉක්මනින් නිවසටම ගෙන්වා ගන්න





| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර | A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත් | School Book | ගුරු අත්පොත්

pesuru Prakashana Private Ltd. | Akura Pilot | සමනල දැනුම | T | සතර

පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර, කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා

සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට

**www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න**